# ශ්‍රී ලංකාවට නිදහස ලැබීම

## 6.1 කියවීම් පත්‍රිකාව

1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් ඡන්ද විමසීම් ක්‍රම

- ජනාධිපතිවරණය

ජනාධිපතිවරණයකදී ශ්‍රී ලංකාව ම එකම ඡන්ද කොට්ඨාසයක් බවට පත්වේ. ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාවෙන් නියත බහුතරයක් හෙවත් 50% ක් ඉක්මවූ ඡන්ද ප්‍රමාණයක් ලබා ගන්නා අපේක්ෂකයා ජයග්‍රහණය කරයි .ව්‍යවස්ථාවට අනුව වසර හයක ධුර කාලයෙන් වසර හතරක් ගත වූ පසුව නැවත දෙවන වරමක් ඉල්ලා ජනාධිපතිවරණයකට යොමු යොමු විය හැකි බව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කරන ලද දෙවැනි සංශෝධනය මගින් හඳුන්වා දුනි.

- සමානුපාතික නියෝජන ක්‍රමය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් නවාංගයක් වන මෙමගින් මෙමගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන් හා වෙනත් පළාත් පාලන ආයතන සඳහා නියෝජිතයන් තෝරා පත් කර ගනු ලබන සියලු මැතිවරණවලදී සමානුපාතික නියෝජන ක්‍රමය යොදා ගැනේ .මෙම නියෝජන ක්‍රමයට අනුව අපේක්ෂකයන් කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් වේ .විවිධ ඡන්ද කොට්ඨාස සඳහා තෝරා ගන්නා මන්ත්‍රීවරුන් ගණන මැතිවරණයට පෙර ප්‍රකාශ කෙරෙන අතර ඡන්දදායකයින් ඡන්දය භාවිතා කිරීමේ දී අදාළ පක්ෂයට ඡන්දය ලබා දී ඉදිරිපත් කර ඇති අපේක්ෂකයාට මනාපය සටහන් කළ යුතුය .එහිදී ඒ ඒ පක්ෂ ලබා ලබාගත් ඡන්ද දී ඒ ඒ පක්ෂ ලබා ගත් ඡන්ද සංඛ්‍යාවට අනුපාතිකව පක්ෂයට හිමි ආසන ගණන තීරණය වන අතර අපේක්ෂකයින් ලබාගත් මනාප ප්‍රමාණය අනුව ඒ ඒ අපේක්ෂකයාට ජයග්‍රහණය හිමි වේ .

- ජනමත විචාරණය

ජාතික වැදගත්කමකින් යුත් කරුණක් සම්බන්ධයෙන් සෘජුවම මහජන මතය ලබා ගන්නා ක්‍රම ජනමත විචාරණය ලෙස හැඳින්විය හැක .මෙහිදී එක් නියමිත කරුණක් සඳහා තම අභිමතය ඔව් හෝ නැත ලෙස ප්‍රකාශ කරන ප්‍රශ්නයකට පිළිතුරු ලබා ගැනීම සිදු වේ. ලංකාවේ පැවති එකම ජනමත විචාරණය වන්නේ 1982 පැවති පාර්ලිමේන්තුවේ නිල කාලය කාලසීමාව දීර්ඝ කර ගැනීම සඳහා පැවැත්වූ ජනමතවිචාරණයයි. ජනමත විචාරණයකට ඉදිරිපත් කරන කරුණක් ජනතා විසින් අනුමත කරන ලද බව පිළිගැනීමට නම් දෙන ලද වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට පනහකට වැඩි ඡන්ද සංඛ්‍යාවක් ලබා ගත යුතුය .